# අයාලේ යන අපේ දේශපාලනය

ශ්‍රී ලංකාවේ තවත් මැතිවරණයක් නිමාවට පත්විය . එහිදී ඇති වු බොහෝ සිද්ධීන් මේ වනවිට අප කව්රුත් හොදින් දන්නා කරුණු බවට පත්වී ඇත්තේ දේශීය මෙන්ම විදේශීය මාධ්‍ය තුලින් ඒ ගැන බොහෝ දේ කථා කල බැවිනි . මේ ලිපියේ අදහස එම මැතිවරණයේ ජයග්‍රාහකයා හෝ පරාජිතයා ගැන හෝ විවේචනයක යෙදීම නොව රටක් ජාතියක් වශයෙන් ඊට වඩා වැදගත් වු කරුණක් සම්බන්ධව යම් අදහසක් ඉදිරිපත් කිරිමය.

දශක තුනක පමණ කාලයක් තුල අප රටේ පැවති මැතිවරණයන් තුල අප කවුරුත් දැක ඇති මැතිවරණ නීති උල්ලංඝනය, මැතිවරන දුෂණ, ප්‍රචන්ඩ ක්‍රියා සහ රාජ්‍ය දේපල අනිසි පරිහරනය වැනි මැතිවරණයකදී සිදු නොවිය යුතු ක්‍රියා පිළිබඳ අදහසක් දැක්වීම මාගේ පරමාර්ථයයි. මෙවැනි සිදුවීම් පිළිබඳ කථා කිරීමේදී පසුගිය <u>එකිනෙකාගේ අදහස් අගයන නිදහසේ තම මතය දැරිය හැකි රටේ දියුණුඅව වෙනුවෙන් පමණක් දේශපලානය කරන සමාජයක් අපේ ආදරණීය මව්බිමේ ඇති වේවා</u>

මැතිවරණය බොහෝ මර්ධන, දුෂණ සහ අසාධාරණකම් සිදූ වු මැතිවරණයක් බව බොහෝ දෙස් විදෙස් ජනමාධය විසින් හුවා දැක්වීම මෙම ලිපිය ලිවීමට මා පොළොඹ වන ලදී.

මා ලංකාවේ සිටි අවධියේ පැවති මැතිවරණයන් බොහෝමයකම මෙවැනි අපරාධ සිදු වු බව මතකය. නමුත් ඒ පිළිබඳ කථා කිරිමට තරම් ඒවා බරපතල නොවු සාමන්‍ය සිදුවීම් ලෙස අපි දුටුවෙමු. ඒ අන් කිසිවක් නිසා නොව කුණු ගොඩක බිහිවී කුණු ගොඩක ජීවත්වන පණුවෙකුට කුනු ගඳ නොදැනෙන නිසා විය යුතුය. අද ශ්‍රී ලාංකීක බොහෝ දෙනෙකුට සිදු වී ඇත්තේ ද එයම බව සිතමි. නොඑසේ නම් ඔවුන් ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කිරිමට බිය වී ඇත. කෙසේ නමුත් ප්‍රජාතන්ත්‍රවාදය බොහෝ ඉහළ මට්ටමක ඇති මෙවැනි රටවල් ජීවත්වන විට අප රටේ පවතින මෙවැනි කණගාටුදයක කාර්යයන් ගැන කථා කිරීමට අපට සිදුවනු ඇත.

ඒ අනුව කිසිවක් නිසා නොව අපේ මව්බිම ජාත්‍යන්තරය හමුවේ හෑල්ලු වනු දැකීමට ඇති අකමැත්ත නිසාය. රටක මැතිවරණ දුෂණ, අයුක්තිය, පුරුවැසියන් බොහෝ දෙනා පක්ෂ දේශපාලනය තුල අන්ධයන් වීම, නොගැලපෙන අය දේශපාලන ක්‍රියාවලට අවතීර්ණය වීම සහ ප්‍රජාතන්ත්‍රවාදය සහ එකිනෙකාගේ අදහස් වලට ගරු කිරීමට අපතුල පවත්වා නොකැමැත්ත ඉන් කිහිපයකි . එමෙන්ම අද අප රටේ දේශපාලකයෙකු වීමට ඇති හොඳම සුදුසුකම් මැර බලය සහ මුදල් බලය තිබීම වීමද තවත් ප්‍රධාන කරුණකි.

පක්ෂ දේශපාලනය බොහෝ රටවල පැවතියද අප රටේ තරම් පක්ෂ පාට අතර අතරමං වු ජනතාවක් මා දැක නැත. දැක ඇත්නම් ඒ ඉන්දියාව , පකිස්ථානය වැනි අපේ අසල්වැසි රටවල පමණකි. අප කෙතරම් පක්ෂ දේශපාලනයේ අතරමං වී ඇත්ද යත් මෙවැනි ප්‍රජාතන්ත්‍රවාදී රටවල පවා කලක් ජීවත් වු අප අතරද තවමත් එවැනි අදහස් දරනනන් ඇති බවත් අපට හැගේ. නිදසුනක් ලෙස පසුගිය සන්නස කලාපයේ පලවු ලිපියක් පිළිබඳ අදහසක් ලියමි. එම ලියුම්කරු දේශපාලකයන් ගැන දැරූ අදහස් මම විවේචනය නොකරමි. නමුත් එම ලිපියෙහි අවසානයේ එතුමා ලියා ඇත්තේ සරත් පොන්සේකා මහතා දේශද්‍රෝහියෙකු වී ඇති බවය. රට ජාතිය වෙනුවෙන් මැරී ඉපදුනු, රුදුරු ත්‍රස්තවාදය පරාජය කිරීමට හමුදවල නායකත්වය දුන් වීරෝධාර හමුද නායකයෙකු වෙනත් මතයක් දැරීම තුලින් හෝ පවතින රජයට විපක්ෂ වීම තුලින් හෝ දේශද්‍රෝහියෙකු වන්නේ කෙසේදැයි මට වටහා ගත නොහැකි ය. එමෙන්ම අයුක්තිය අසාධාරණය මහා සංඝරත්නය අමු අමුවේ මරා දැමු, ශ්‍රී දළඳ මාලිගාවට පවා බෝම්බ ගැසු මහා අපරාධ කළ දරුණු ත්‍රස්ත නායකයින්ය. ඒ අන් කිසිවක් නිසා නොව ඔවුන් තමන්ගේ පක්ෂයට පක්ෂපාතී වීම නිසාය.

එකිනෙකාගේ අදහස් වලට ගරු කිරීමට උත්සාහ දැරීම, විවේචන ඉවසීම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මැඩීමට හැකි ප්‍රධානම මගකි . වසර දහස ගණනක් අප රටතුළ නොනැසී පවතින උතුම් බුදු දහමේ ප්‍රධාන වන්නේ එකිනෙකාට ගරු කිරිම සහ ආදරය කිරිමය. නමුත් අද අප රටතුල මෙවැනි තත්ත්වයක් ඇත්ද? මෙවර මැතිවරණයේදී ද පෙර මෙන්ම අහිංසක තරුණ ජීවිත කිහිපයක්ම අහිමි විය. ඔවුන් කල එකම වරද වුයේ විරුද්ධ මත දැරීමය. මෙය ඉතා පිළිකුල් සහගත තත්වයකි. නියම ප්‍රජාතන්ත්‍රවාදය මුලික හරයයි. මෙවැනි සිද්ධීන් හමුවෙහි අපට අපේ කීර්තිමත් අතීතය ගැන බුදු දහමේ හරය ගැන කථා කල හැකිද?

මෙවැනි විදේශීය රටවල ජීවත්වන අප දැන් කල යුත්තේ පක්ෂ භේද හැර දමා මැතිවරණ ප්‍රචන්ඩත්වය , දුෂණය, භිෂණය, නැති කිරිමට පෙළ ගැසිමය. එවැනි දෑ කුමන පක්ෂයකින් කලද ඉන් සිදු වන්නේ අපේ රට තව තවත් පරිහානියට පත්විම සහ ජාත්‍යන්තය හමුවේ අපේ කීර්තිනාමය තවත් බාල්දු වීමය. එහිදී නියම ජනමතය ඉදිරිපත් වීමට ඉඩ හැරීමය. අප රටේ උන්නතියට අත්‍යාවශ්‍ය දෙයකි එබැවින් විදෙස් රටවල සිංහල අප ඒ වෙනුවෙන් හඬක් නැගිය යුතු කාලය එළඹී ඇත. සහ කුලල් කා ගැනිම් තුල අපේ මව්බිම අද තිබෙන්නේ කොතැනක දැයි අපි හොදින් දනිමු. එය තව තවත් අගාධයට යාමට ඉඩ හැරිය යුතු නැත.

රටක වැසියන්ට අවංක සේවයක් කරන රටේ සංවර්ධනයට තම සියළු ශක්තිය කැප කරණ රටේ සුභසිද්ධිය තමන්ගේ එකම අරමුන කරගත් පක්ෂයකට මැතිවරණ ප්‍රචන්ඩත්වය කිසිසේත්ම අවශ්‍ය නැත. ඡන්දදායකයා නොපැකිලිව එවැනි අයට තම ඡන්දය ප්‍රකාශ කරන බැවිනි. නමුත් අද බල ලෝභය, තණහාව, සහ සුරා කෑම වෙනුවෙන් කණ්නාඩි දමාගත් ඡන්ද දයකයාද එම රැල්ලට හසු වී හමාරය. නමුත් මැතිවරණයකදී තම පක්ෂය වෙනුවෙන් ගහමරා ගන්නා අහිංසකයා මැතිවරයෙන් පසු නැවත කසල ගොඩ විසීවිම අප රටේ හැමදමත් සිදුවන්නකි. දේශපාලනයෙන් තම මඩිය තරකර ගන්නේ අතලොස්සක් පමණි. එවැවින් සාධාරණ මැතිවරණයකට, යහ පාලනයකට, අවංකව දේශය ගොඩ නැගීමකට දේශ පාලකයින් තල්ලු කළයුතු කාලය දැන් එළඹ ඇත. නොඑසේනම් අපේ ආදරණී මව්බිම තව වසර ගනනාවක් එකතැන පල්වනු ඇත. ඉන්දියාව , සිංගප්පුරුව වැනි අපේ අසල්වැසි රටවලින්ද ප්‍රජාතන්ත්‍රවාදය මානව හිමිකම් ඇගයීම අතින් ඉහළ ඕස්ට්‍රේලියාව වැනි රට වලින්ද අප පාඩම් ඉගෙන ගත යුතුය. විශේෂයෙන් විදෙස් ගතවී සිටි අප අපේ අත්දැකීම් තුලින් ප්‍රජාතන්ත්‍රය , එකිනෙකාට ගරු කිරිම, රටේ දියුණුවට අත්වැල් බැඳ ගැනීම වැනි කරුණු අපේ රට තුල ස්ථාපිත කිරිම , පෙල ගැසිය යුතුය. ඒ සදහා පක්ෂ පාට තුල අතරමං වී ඇති අපේ දෑස විවර කොට නිවැරදි ව දැක්මක් ඇතිකර ගැනීම වැදගත් වනු ඇත.

අද බොහෝ ජනමාධ්‍ය මෙන්ම ජනතාවද, මහා සංඝරත්නයද මේ සදහා පෙළ ගැසෙන ආකාරයක් පෙනෙන්ට ඇත. විදෙස් ගතවී සිටින අපද අපේ මව්බිමේ සහ අපේ දු දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඔවුන් හා පෙළ ගැසිය යුතුය. එකිනෙකාට ගරු කරන, සාධාරණ අගයන යුක්ත සහගත සමාජයක් තුලින් අප රට දීප්තිමත් වනු දැකීම මගේ ප්‍රාර්ථනයයි. එය යුක්ති සහගත බුද්ධිමත් ඔබගේද ප්‍රාර්ථනය බව මම හොඳින් දනිමි. එබැවින් එකිනෙකාගේ අදහස් අගයන නිදහසේ තම මතය දැරිය හැකි රටේ දියුණුඅව වෙනුවෙන් පමණක් දේශපලානය කරන සමාජයක් අපේ ආදරණීය මව්බිමේ ඇති වේවායි අපි එක්ව ප්‍රාර්ථනා කරමු.

අශාන් කුමාරගේ
මෙල්බර්න්

